(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 5(6).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා**

**2017 පෙබරවාරි මස 21 වැනි අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය පනත යටතේ නියෝග,— 2006 අංක 27 දරන ජාතික දුම්කොළ හා මද්‍යසාර අධිකාරිය පනතේ 33 වගන්තිය සමඟ කියවිය යුතු, 30 වගන්තිය යටතේ නියමිත ආකාරයේ දුම්කොළ නිෂ්පාදන සෑදීම හෝ අලෙවිය තහනම් කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 සැප්තැම්බර් 01 දිනැති අංක 1982/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ 2016 දෙසැම්බර් 15 දිනැති අංක 1997/22 දරන සංශෝධිත අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 (2) වගන්තිය යටතේ එකී පනතේ කාල සීමාව සම්බන්ධයෙන් අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජනවාරි 18 දිනැති අංක 2002/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය,— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(4) වගන්තිය යටතේ යෝජිත ව්‍යාපෘතියට අදාළ නිදහස් කිරීම් සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 ජනවාරි 30 දිනැති අංක 2004/29 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් සංශෝධිත 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.02.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2017 මාර්තු මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

465/’16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) (i) 2015 වසර තුළ ජනාධිපතිතුමා සහභාගි වූ විදේශ සංචාර කවරේද;

(ii) එකී එක් එක් විදේශ සංචාරයට සහභාගී වූ පුද්ගලයන්ගේ නම්, තනතුරු සහ එම පුද්ගලයන් වෙනුවෙන් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

547/’16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ රන් හා රිදී කර්මාන්තයේ නියුතු විශාල පිරිසක් සිටින බවත්;

(ii) රන් හා රිදී මිල ඉහළ යාම හා වෙනත් හේතූන් නිසා මෙම කර්මාන්තය බිඳ වැටෙමින් පවතින බවත්;

(iii) මෙම කර්මාන්තයේ නියුතුවූවන්ට රැකියා අහිමිවීමේ අවදානමක් ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත කර්මාන්තයේ නියුතු පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුද්ගලයන්ට නව කර්මාන්ත දියුණුකර ගැනීමට රජයෙන් සහන ලබාදීමට කටයුතු කර තිබේද;

(iii) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රන් හා රිදී මිල පාලනයට රජයෙන් ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

902/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දේශපාලන පළිගැනීම්වලට ලක්වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවකයන්ට සහන සැලසීම සඳහා නව රජය යටතේ කමිටුවක් පත්කර හෝ වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුව පත්කර හෝ වැඩපිළිවෙළ සකස් කර ඇත්තේ කැබිනට් අනුමතියක් යටතේද; එසේ නම්, එම අනුමතිය ලද දිනය කවරේද;

(iii) දේශපාලන පළිගැනීම් සඳහා සහන ලබාදීමට සළකා බලන කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළිගැනීමට ලක්වූවන්ට සහන ලබාදීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩපිළිවෙළ කවරේද;

(ii) එසේ පළිගැනීමට ලක්වී, සහන ලබා උසස්වීම් ලද පුද්ගලයන්ගේ නම්, පළිගැනීමට ලක්වූ හේතුව සහ ඔවුන්ට ලබා දුන් සහනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඔවුන්ට උසස්වීම් සමඟ හිඟ වැටුප් ලබා දෙන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

928/'16

ගරු බිමල් රත්නායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015.01.08 සිට 2016.08.01 දක්වා ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා පත්කළ ශ්‍රී ලංකා විදේශ සේවයේ නිලධාරීන් නොවන පුද්ගලයන්ගේ නම්, උපන් දිනයන්, ශ්‍රී ලංකාවේ ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපුරුද්ද, පත්කළ රටවල් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් අතරින් ද්විත්ව පුරවැසි/විදේශ පුරවැසි තත්ත්වයන් හිමි පුද්ගලයන් කවුරුන්ද;

(iii) දේශපාලනිකව පත්කළ මෙම පුද්ගලයන්ට පැවරූ රාජකාරි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

981/'16

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ ඇති විදුලි ජනක යන්ත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදුලි ජනක යන්ත්‍රය විදුලිය උත්පාදනය කිරීම ආරම්භ කරන ලද වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී විදුලි ජනක යන්ත්‍ර සඳහා ශ්‍රී ලංකා රජය දරා ඇති සම්පූර්ණ වියදම කොපමණද;

(iv) මෙම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ලද්දේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබා ගන්නා ලද ණය මුදල ආපසු ගෙවනු ලබන ආකාරය කවරේද;

(ii) ණය මුදල ගෙවනු ලබන්නේ ලංකා විදුලිබල මණ්ඩලය විසින්ද; නොඑසේ නම්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින්ද;

(iii) වසරකට ගෙවනු ලබන වාරිකවල මුළු එකතුව ඇමරිකානු ඩොලර් මිලියන කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

985/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015.12.31 දිනට ශ්‍රී ලංකාවේ විදුලිබල උත්පාදන ධාරිතාවය කොපමණද;

(ii) පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් මඟින් උත්පාදනය කරනු ලබන විදුලිබලය, සම්පූර්ණ විදුලිබල උත්පාදන ධාරිතාවයෙහි ප්‍රතිශතයක් වශයෙන් කවරේද;

(iii) ලෝකයේ විදුලිබල උත්පාදනය සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභේදයන් භාවිතා කරනු ලබන රටවල් අතර ශ්‍රී ලංකාවට හිමි ස්ථානය කවරේද;

(iv) සූර්ය බලය, සුළං බලය සහ ජෛව ස්කන්ධ බලශක්ති ප්‍රභවයන් ඇසුරින් විදුලිය උත්පාදනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජය හෝ රජයට සම්බන්ධ ආයතන විසින් පසුගිය වසර 10 තුළ සිදුකර ඇති ආයෝජනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සුළං බලය, සූර්ය බලය සහ ජෛව ස්කන්ධ බලය ඇසුරින් විදුලිය උත්පාදනය කිරීමට අදාළව රජය විසින් කරනු ලබන ආයෝජනය අවම වීමට හේතුව කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1003/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ පෞද්ගලික විදුලි බලාගාර ඉදිකිරීම සඳහා අනුමතිය ලබාගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත මේ වනවිට ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව, ප්‍රභවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට ක්‍රියාත්මක බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iii) බලපත්‍ර ලබාගෙන ක්‍රියාත්මක නොවන යෝජනා ක්‍රම කවරේද;

(iv) ඉහත (iii) සඳහා හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් නිතිපතා පාරිසරික පසු විපරම් සිදු කරන්නේද;

(ii) නොඑසේ නම්, පාරිසරික පසු විපරම් සිදු කරන වාරයන් කවරේද;

(iii) යෝජිත "ඉහළ කදුරුගල් දොළ" කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතිය සඳහා ලබා දී ඇති මූලික පරිසර අධ්‍යයන ඇගයීම් වාර්තාවේ පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1009/'16

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, එගොඩ කළුගමුව ජනපදයේ පදිංචිකරුවන් අතරින්, මේ වනවිට රජය මඟින් ස්ථිර ඔප්පු ලබාදී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පදිංචිකරුවන් අතර, මෙතෙක් ඔප්පු ලබාදී නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එකී ජනපදයේ වසර පනහකට අධික කාලයක් පදිංචිවී සිටින ඉඩම්ලාභීන් සඳහා ඔප්පු ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1012/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කොළඹ නගරයේ එක් රැස් වන වැසි ජලය මුහුදට බැස යාම සඳහා භූගත නල පද්ධතියක් ඉදිකිරීමේ සැලසුමක් තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම සැකසීම සඳහා උපදේශක සේවා සපයනු ලබන ආයතනය කවරේද;

(iii) එම ආයතනය තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) මෙම ව්‍යාපෘතිය සඳහා ණය හෝ ආධාර ලබා දෙන ආයතනය කවරේද;

(vi) ඉහත (v) හි සඳහන් ණය හෝ ආධාර මුදල කොපමණද;

(vii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යෝජිත කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1019/'16

ගරු නාමල් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015 ජනවාරි මාසයේ සිට මේ දක්වා කාලය තුළ ජනාධිපතිතුමා විසින් විවෘත කරන ලද රාජ්‍ය හා සංස්ථාපිත ආයතනවලට අයත් ගොඩනැගිලි හා අනෙකුත් ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඉදිකිරීම්වලින්, 2015 ජනවාරි මාසයෙන් පසුව ආරම්භ කරන ලද ඉදිකිරීම් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1099/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ගම්මාන රාශියක් මුහුදු ඛාදනයට ලක්වීමේ තර්ජනයකට ලක්වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, එම ගම් කවරේද;

(iii) එසේ මුහුදු බාදනයට ලක් වූ ගම්මාන හා ජනතාව වෙනුවෙන් යම් සහනශීලී වැඩසටහනක් අමාත්‍යාංශය මඟින් දියත් කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1215/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) L.T.T.E. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට, වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1282/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ සුනාමි ව්‍යසනයෙන්,

(i) හානියට පත් නිවාස සංඛ්‍යාව;

(ii) විනාශ වූ හෝ අර්ධ වශයෙන් විනාශ වූ නිවාස වෙනුවට ඉදිකර ඇති නව නිවාස සංඛ්‍යාව;

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (ii) සඳහන් නිවාසවලින් මේ වනවිට බෙදා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස හිමි වූ පුද්ගලයන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) මේ වනවිට සුනාමි නිවාසයන්හි ජීවත්වන පුද්ගලයන් කොපමණ සංඛ්‍යාවකට ඔප්පු ලබා දී තිබේද;

(iv) ඉහත (iii) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙතෙක් ඔප්පු හිමි නොවූ නිවාසලාභීන් සඳහා කඩිනමින් ඔප්පු පිරිනැමීමට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(vi) ඔප්පු ලබා දෙන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

697/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ලාක්ෂා ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තය ජීවිකාව කරගත් පිරිස මේ වනවිට එම කර්මාන්තයෙන් ඉවත් වෙමින් සිටින බවත්;

(ii) අමුද්‍රව්‍ය හා වෙළඳපොළ පිළිබඳව ගැටලු පවතින බවත්;

(iii) මෙම කර්මාන්තය තුළින් රටට විශාල විදේශ විනිමයක් ගෙන ආ හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ලාක්ෂා නිෂ්පාදන අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2015 වසර තුළ ලබාගත් අපනයන ආදායම කොපමණද;

(iii) අපනයනය නොකරන්නේ නම්, අපනයනය කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රට තුළ ලාක්ෂා කර්මාන්තයට අවශ්‍ය වෙළඳපොළ පුළුල් කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

945/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015.12.09 දින සිට 2016.09.30 දින දක්වා වූ කාලය තුළදී පත් කරන ලද තානාපතිවරයන්, මහ කොමසාරිස්වරයන්, නියෝජ්‍ය තානාපතිවරයන්, නියෝජ්‍ය මහ කොමසාරිස්වරයන් සහ එම මට්ටමේ වෙනත් තනතුරු දරන ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරින් සහ විදේශ සේවයට අයත් නොවන නිලධාරින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2016.09.30 දින වනවිට ඉහත (i)හි සඳහන් වන තනතුරු දරන ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නොවන නිලධාරින්ගේ නම්, වෘත්තීය සුදුසුකම්, ඉහළම අධ්‍යාපන සුදුසුකම් සහ වර්තමානයේ දරන තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 මාර්තු මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

684/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික පරිභෝජනයට අවශ්‍ය එළු, කුකුළු, ඔටු, බැටළු හා ගව මස් ප්‍රමාණය දළ වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කිරීමට හැකියාව තිබේද;

(iii) නොඑසේ නම්, ආනයනය කරන්නේද;

(iv) ආනයනය කරන්නේ නම්, 2016 වර්ෂය තුළ ආනයනය කළ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකාවට මස් ආනයනය කරන ප්‍රධාන රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව මස් අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, 2016 වර්ෂය තුළ අපනයනය කළ අ(i) හි සඳහන් මස් වර්ග ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016 වර්ෂයේ මස් අපනයනයෙන් ලැබූ ආදායම කොපමණද;

(iv) ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව මස් පිණිස ඝාතනය කරනු ලබන එළුවන්, කුකුළන් හා ගවයන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

903/'16

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවක සංඛ්‍යාවට (cadre) අනුව අධිකාරියේ ස්ථිර තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i) හි සඳහන් තනතුරු කවරේද;

(iii) දැනට වැඩ බලන තත්ත්වයේ පවතින තනතුරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම තනතුරු කවරේද;

(v) වැඩබලන තනතුරු සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

982/'16

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සූර්ය බලය උපයෝගී කරගෙන ශ්‍රී ලංකාවේ උත්පාදනය කරනු ලබන විදුලිබල ප්‍රමාණය කොපමණද;

(ii) පුරවැසියන් විසින් තම නිවෙස්වල හෝ ව්‍යාපාරික ගොඩනැගිලිවල සවිකරනු ලැබූ සූර්ය කෝෂ මඟින් නිෂ්පාදනය කර ජාතික පද්ධතියට දිනකට එකතු කරනු ලබන විදුලිබල ප්‍රමාණය කොපමණද;

(iii) සූර්ය බලය මඟින් විදුලිය නිෂ්පාදනය කෙරෙහි දක්වා ඇති සැළකිල්ල අඩු වීමට හේතුව කවරේද;

(iv) සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කර එම විදුලිය ජාතික පද්ධතියට එකතු කරනු ලබන තම පාරිභෝගිකයන්ට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

997/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) වර්ෂ 1972 සිට 2009 දක්වා කාලය තුළදී දෙමළ බෙදුම්වාදී ත්‍රස්තවාදය හේතුකොට ගෙන;

(i) මියගිය සහ තුවාල ලැබූ සිවිල් ආරක්ෂක බලකායද ඇතුළුව හමුදා සාමාජිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මියගිය සහ තුවාල ලැබූ ත්‍රස්තවාදීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මියගිය සහ තුවාල ලැබූ සාමාන්‍ය ජනතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1004/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) යුද්ධයෙන් පසුව සරණාගත කඳවුරුවල ජීවත්වන දෙමළ ජනතාවට අයත් රත්‍රන් විශාල ප්‍රමාණයක් කවුරුන් හෝ භාරයේ තබා තිබේද;

(ii) මෙම රත්‍රන් තැන්පතු ගණනය කර තිබේද;

(iii) එම පුද්ගලයන්ගේ රත්‍රන් මෙතෙක් ඔවුන් වෙත යළි ලබා දී නොමැති බවට පැමිණිලි කර තිබේද;

(iv) ඉහත (i) සම්බන්ධයෙන් පවතින තොරතුරු කවරේද;

(v) එම හිමිකම්පෑම නිරාකරණය කිරීම සඳහා රජය මඟින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1134/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වසරේ අග භාගයේදී රට තුළ සහල් හිඟයක් ඇති වූ බවට ලංකා සතොස වෙත වාර්තාවක් ඉදිරිපත් කර තිබුනේද;

(ii) එසේ නම්, ඒ අනුව ආනයනය කරන ලද සහල් ප්‍රමාණය කොපමණද;

(iii) සහල් ආනයනය කරන ලද කාල වකවානු කවරේද;

(iv) ඒ සඳහා කැබිනට් අනුමතිය ලබා ගෙන තිබේද;

(v) ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේද;

(vi) එසේ නම්, මිල ගණන් ඉදිරිපත් කළ සමාගම් කවරේද;

(vii) මෙම සහල් තොගයේ වටිනාකම කොපමණද;

(viii) එම සහල් තොගය ගබඩාකර තබන ලද රජයේ හා පෞද්ගලික අංශයේ ගබඩා කවරේද;

(ix) සහල් ගබඩා කිරීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(x) පෞද්ගලික අංශයේ ගබඩා පහසුකම් ලබාගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1225/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) L. T. T. E. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1288/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වත්මන් රජය විසින්, ලෝක බැංකු ආධාර ව්‍යාපෘතියන් වශයෙන් ක්‍රියාත්මක කරන බවට විශාල ප්‍රචාරයක් ලබා දී ඇති, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැලසෙන ප්‍රභවයන් කවරේද;

(ii) ලෝක බැංකුව වෙත ඉහත කී ව්‍යාපෘතිය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් හෝ යෝජනාවක් ඉදිරිපත් කර ඇත්නම්, එම දිනය කවරේද;

(iii) ලෝක බැංකුව විසින් ඉහත කී ව්‍යාපෘතිය අනුමත කර ඇති දිනය කවරේද;

(iv) පිරිනමා ඇත්තේ ණය මුදලක්ද; ආධාරයක්ද; නොඑසේනම්, ප්‍රදානයක්ද;

(v) ඉහත (iv) හි සඳහන් මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතිය යටතේ භෞතික හා යටිතල පහසුකම් නැංවීම සඳහා තෝරාගෙන ඇති මාතර දිස්ත්‍රික්කයේ පාසල් කවරේද;

(ii) එම එක් එක් පාසල් සඳහා වෙන් කරනු ලැබ ඇති ප්‍රතිපාදනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

848/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, වහකෝට්ටේ ප්‍රදේශයේ, පෘතුගීසී සම්භවයක් සහිත පුද්ගලයන් ජීවත්වන ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(ii) දැනට එම ප්‍රදේශවල ජීවත්වන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුද්ගලයන් ලංකාවේ වෙනත් ප්‍රදේශවල ජීවත්වන බවට වාර්තා වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ජනතාවට අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා සෞඛ්‍ය යන මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමේ අයිතිය රජය විසින් තහවුරු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ජනතාවගේ සංස්කෘතික අනන්‍යතාවයන් හා පාරම්පරික උරුමයන් රැකගෙන ජීවත්වීම සඳහා රජය අනුග්‍රහයන් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම අනුග්‍රහයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

983/'16

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2015 වර්ෂයේ පැවති කාලගුණ විපර්යාස පිළිබඳ පැරිස් සමුළුවේදී ගනු ලැබූ තීරණ කවරේද;

(ii) එකී තීරණ පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ එකඟත්වය පළකර තිබේද;

(iii) එසේ නම්, එම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1018/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වේරස් ගඟ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සුනේත්‍රාදේවී පාර දක්වා සිදු කර මේ වනවිට නතර වී ඇති බවත්;

(ii) ඉදිකිරීම් කටයුතු නතර කිරීම නිසා අවට ප්‍රදේශයේ මදුරු ගහනය විශාල වශයෙන් වැඩි වී ඩෙංගු වැනි මාරාන්තික රෝග ව්‍යාප්ත වී ඇති බවත්;

(iii) සුනේත්‍රාදේවී පාරේ පදිංචි සිවිල් ඉංජිනේරු තිස්ස ද සිල්වා නමැති අය මේ පිළිබඳව මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නිහාල් රූපසිංහ මහතා දැනුවත් කර ඇතත්, ප්‍රතිඵලයක් නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ සම්බන්ධයෙන් ගැනීමට අපේක්ෂිත පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1043/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල වාර්ෂික සැසිය සඳහා ජනාධිපතිතුමාගේ සංචාරයට සහභාගි වූ දූත පිරිස කොපමණද;

(ii) උක්ත සංචාරයට සහභාගි වූ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දූත පිරිසට ඇතුළත් වූ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරය සඳහා රජය, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් විසින් දැරූ සම්පූර්ණ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1136/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.09.01 දින සිට 2016.10.01 දින දක්වා,

(i) රජයේ ගොඩනැගිලිවල පවත්වාගෙන ගිය අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ කවරේද;

(ii) කුලී පදනම මත ලබාගෙන පවත්වාගෙන යන රාජ්‍ය අමාත්‍යාංශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලිවල,

(i) මාසික කුලිය;

(ii) වර්ග ප්‍රමාණය;

(iii) අත්තිකාරම් ගෙවූ මුදල හා කාලය;

(iv) ගොඩනැගිලි හිමිකරුවාගේ නම හා ලිපිනය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) කුලී පදනම ලෙස ලබාගෙන ඇති ගොඩනැගිලි සඳහා මාසිකව ගෙවන මුළු කුලී මුදල හා ගෙවා ඇති මුළු අත්තිකාරම් මුදල කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1234/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ අවසන් වරට කරන ලද වන අලි සංගණනය අනුව රක්ෂිත හා අභය භූමිවල සිටින සමස්ත වන අලි සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට අලි මිනිස් ගැටුම උග්‍රව පවතින දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරි වසම් මට්ටමේ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම ග්‍රාම නිලධාරි වසම්වල ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ප්‍රදේශවල ගොවිතැන් කරනු ලබන ගොවිබිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015 සහ 2016 වර්ෂවල මේ දක්වා අලි මිනිස් ගැටුම අවම කිරීමට ගත් පියවර සඳහා වැය කරන ලද සමස්ත මුදල කොපමණද;

(ii) එහි සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1290/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාතර දිස්ත්‍රික්කයේ තේ වගා කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2013 සිට 2016 දක්වා මාතර දිස්ත්‍රික්කයේ,

(i) තේ ඉඩම් වලින් ලබාගත් අස්වැන්න;

(ii) රජයේ පොහොර සහනාධාරය ලබා ගත් ගොවීන් සංඛ්‍යාව;

(iii) තේ ගොවීන් සඳහා රජයේ පොහොර සහනාධාරය යටතේ ලබා දුන් පොහොර ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 මාර්තු මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

861/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යුද බිමේදී මියගිය හා ආබාධිත වූ රණවිරුවන්ගේ පවුල් මේ වනවිට සමාජ, ආර්ථික ගැටළු රාශියකට මුහුණ දෙන බවත්;

(ii) ඔවුන් රැක බලා ගැනීම රටේ සියලුදෙනාගේම වගකීම බවත්;

(iii) එම බිරින්දෑවරුන්ගේ හා දරුවන්ගේ සුබසාධනය වැඩි කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත රණවිරු පවුල්වල සුබසාධනය සඳහා රජය ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් කවරේද;

(ii) මෙම පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු හා රැකියා අවශ්‍යතා සම්බන්ධයෙන් රජය මැදිහත්වීමක් සිදුකර තිබේද;

(iii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

984/'16

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ සිටින විදුලි පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකාවේ විදුලි පාරිභෝගිකයන් අතරින්, ලංකා විදුලිබල මණ්ඩලය මඟින් විදුලි සබඳතා ලබා දී ඇති පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ලංකා විදුලි පෞද්ගලික සමාගම විසින් විදුලි සබඳතා ලබා දී ඇති පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන බවට මෑතකදී ප්‍රකාශ කරන ලද සුහුරු මාපක (Smart Meters) මඟින් ඉටු කරගැනීමට අපේක්ෂිත අරමුණු කවරේද;

(ii) මේ වනවිට සවිකොට ඇති සුහුරු මාපක (Smart Meters) සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් යෝජනාව අනුව ශ්‍රී ලංකාවේ සියලු විදුලි පාරිභෝගිකයන්ට ඉහත සුහුරු මාපක සපයා අවසන් කිරීමට අපේක්ෂා කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1070/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1983 ජූලි සහ අගෝස්තු මාසයන්හි සිදු වූ ජාතිවාදී කෝලහල හේතුවෙන්,

(i) මිය ගිය, තුවාල වූ සහ අවතැන් වූ සිංහල පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මිය ගිය, තුවාල වූ සහ අවතැන් වූ මුළු සිංහල පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1093/'16

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ වැව් ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය යටතේ දැනට පුත්තලම දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කර ඇති වැව් කවරේද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1138/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට පවතින ශික්ෂණ රෝහල් කවරේද;

(ii) එම එක් එක් ශික්ෂණ රෝහලෙන් සායනික පුහුණුව ලබා දෙනු ලබන රජයේ විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ කවරේද;

(iii) මාලබේ ප්‍රදේශයේ "වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු ශ්‍රී ලංකා - රුසියානු මිත්‍රත්ව ශික්ෂණ රෝහල" නමින් පෞද්ගලික රෝහලක් පවත්වාගෙන යන්නේද;

(iv) එම පෞද්ගලික රෝහලට ශික්ෂණ රෝහලක් ලෙස හඳුන්වාදීමට සෞඛ්‍ය අමාත්‍යාංශයේ අවසරය ලබාදී තිබේද;

(v) එසේ නම්, එම අවසර ලබාදුන් ලේඛනය සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1167/'16

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය යටතේ ආරම්භ කරන ලද මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2014 වර්ෂය අවසන් වනවිට නාගරික සංවර්ධන අධිකාරිය විසින් වැය කර තිබූ මුදල කොපමණද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා පසුගිය රජය සමයේ විදේශ ආධාර හරහා වෙන් කළ මුදලින් ඒ වනවිට ලැබී තිබූ ප්‍රමාණය කොපමණද;

(iii) නව යහපාලන රජය බලයට පත් වී මාස 20ක පමණ කාලයක් ගත වී ඇතත්, එම කාලය තුළ මෙම ව්‍යාපෘතියේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදු වී නැති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරයක් වන මහනුවර වැනි නගරයක, නගර සංවර්ධන ව්‍යාපෘතියක් ඇත්හිටුවීමට අමාත්‍යාංශය කටයුතු කර තිබේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1236/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට පැවැති මුළු මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් තාර දමා තිබූ මාර්ග සංඛ්‍යාව සහ කි.මී. ප්‍රමාණය කොපමණද;

(iii) වර්ෂ 1983 සිට යුද්ධය නිම වනතුරු එම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදිකිරීම සඳහා පැවති රජයන් විසින් වියදම් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යුද්ධය නිම වීමෙන් පසු මෙම දිස්ත්‍රික්කය තුළ මාර්ග ඉදි කිරීම වෙනුවෙන් එක් එක් වර්ෂය තුළ වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඒ පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1280/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "සැමට විදුලිය" තේමාව යටතේ පසුගිය පාලන කාලය තුළ විදුලි ජනනය, විදුලිය බෙදා හැරීම සහ නව සම්බන්ධතා ලබා දීම යන ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන මෙහෙවරක් ඉටුකරනු ලැබූ බව පිළිගන්නේද;

(ii) වර්ෂ 2013 සිට 2016 දක්වා, මාතර දිස්ත්‍රික්කය තුළ ලබා දී ඇති විදුලි සම්බන්ධතාවයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව සහ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාතර දිස්ත්‍රික්කයේ ජාතික විදුලිබල පද්ධතිය ඔස්සේ විදුලිය ලබා දීමට හැකියාව ඇතත්, මේ දක්වා විදුලිය ලබා දී නොමැති නිවාස සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ජාතික විදුලිබල පද්ධතියෙන් විදුලිය ලබා දිය නොහැකි/අපහසු නිවාස හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම නිවාස සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත (ii) හි සඳහන් නිවාස සඳහා විදුලිය ලබාදීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1348/'16

ගරු ලකී ජයවර්ධන මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයට විදුලිය සපයන කුඩා විදුලි බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායින් මණ්ඩලය සහ පෞද්ගලික අංශය සතු බලාගාර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් බලාගාර පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) මණ්ඩලය සතු විදුලි බලාගාරවලින් උත්පාදනය කරනු ලබන මුළු විදුලි ධාරිතාවය කොපමණද;

(v) එක් එක් බලාගාරයෙහි ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පෞද්ගලික විදුලි බලාගාරවලින් මණ්ඩලය වසරකට ලබා ගන්නා මුළු ධාරිතාවය කොපමණද;

(ii) එක් එක් ආයතනයෙන් ලබා ගන්නා විදුලි ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් විදුලිය සඳහා ගෙවනු ලබන මුළු මුදල කොපමණද;

(iv) එම මුදල ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) පෞද්ගලික විදුලි බලාගාරවලින් සපයන විදුලිය සඳහා එම ආයතනවලට ආරම්භයේ සිට මේ දක්වා ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) මේ වනවිට මණ්ඩලයේ අනුමතිය සහිතව තවත් කුඩා විදුලි බලාගාර ඉදිකිරීමට යෝජිතව තිබේද;

(vii) එසේ නම්, ඒවා කවරේද;

(viii) ඒවා ඉදිකිරීමට යෝජිත ස්ථාන සහ ඒවායේ හිමිකරුවන් කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1363/'16

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන ප්‍රකාරව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි වගාව සහිත ඉඩම්වලින්, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට හා ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ගැසට් නිවේදන මඟින් පාලනය හා කළමනාකරණය සඳහා පවරා ඇති ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව එම ඉඩම්වල නම් සහ ප්‍රමාණයන් කවරේද;

(iii) එම ඉඩම් මැන මායිම් හඳුනාගෙන තිබේද;

(iv) ඉහත ආයතන විසින් එකී වතු පාලනය හා කළමනාකරණය කිරීමෙන් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය කොපමණද;

(v) එකී ඉඩම්වලින් මෙම ආයතනවල සෘජු පාලනය යටතේ පවතින ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රාදේශීය වැවිලි සමාගම් විසින් පාලනය කරනු ලබන ඉඩම් ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම් අදාළ සමාගම් වෙත ලබා දී ඇත්තේ බදු ගිවිසුම් මතද;

(iii) එසේ කිරීමට එම ආයතනවලට නීත්‍යානුකූල අයිතියක් පවතීද;

(iv) අදාළ වැවිලි සමාගම් ඉහත වතු කළමනාකරණය තුළින් ආර්ථිකයට දක්වන දායකත්වය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1371/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 125ට අනුව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට සහාය වන ඉන්කියුබේටරයක් ලෙස කටයුතු කරන "මිනි කාර්මික උද්‍යාන" ව්‍යාපෘතියෙහි ප්‍රගතිය කවරේද;

(ii) මෙම කාර්මික උද්‍යාන පිහිටුවීමට යෝජිත මොනරාගල, පුත්තලම, යාපනය, වන්නි සහ අම්පාර දිස්ත්‍රික්කවල ඉඩම් තෝරා ගෙන තිබේද;

(iii) මෙම මිනි කාර්මික උද්‍යාන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඉහත සඳහන් දිස්ත්‍රික්කවල දිසා ලේකම්වරුන් දැනුවත් කර තිබේද;

(iv) එසේ නම්, ඉහත රජයේ නිළධාරීන්ගෙන් ලැබුන වාර්තාවන් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

862/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් නගා සිටුවීම තුළින් රටේ ආර්ථිකයට විශාල ශක්තියක් ලබා ගත හැකි බවත්;

(ii) එමඟින් විරැකියාව දුරු කිරීමට හැකි බවත්;

(iii) එය විදේශ විනිමය ගෙන ඒමේ මාර්ගයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් නගා සිටුවීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

(iii) සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තකරුවන් වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන රජයේ ආයතනයන්හි භෞතික හා මානව සම්පත් සංවර්ධනයට රජය කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1005/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015.01.10 දින සිට 2016.09.30 දින දක්වා කුලී පදනම මත ලබා ගෙන ඇති ගොඩනැගිලිවල අමාත්‍යාංශ සහ අමාත්‍ය කාර්යාල පවත්වාගෙන යනු ලබන අමාත්‍යාංශ කවරේද;

(ii) එකී ගොඩනැගිලිවල මාසික කුලිය වෙන් වෙන් වශයෙන් සහ සමස්ත එකතුවක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1284/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙව්නුවර, වෙහෙල්ගොඩ, "ප්‍රේමසිරි" නිවසේ පදිංචි, එච්. කේ. ප්‍රේමතිලක මහතා 1978.05.05 සිට 1986.11.10 දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදා ස්වේච්ඡා ගුවන් භටයෙකු වශයෙන්ද, 1986.11.03 සිට 1995.11.30 දක්වා කම්කරු දෙපාර්තමේන්තුවේ පෙදරේරු පුහුණු උපදේශයෙකු වශයෙන්ද, 1995.11.30 සිට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අනුයුක්තව සේවය කළ බවත්;

(ii) වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් 2015.09.18 වැනි දින ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියෙන් විශ්‍රාම ගන්වා ඇති බවත්;

(iii) රාජ්‍ය සේවයේ වසර 33 මාස 04 දින 13 ක් සේවය කළද ඔහුගේ විශ්‍රාම වැටුප් ගණනය කර නොමැති බවත්;

(iv) කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද කාලයට අදාළව විශ්‍රාම වැටුප් ලබා ගැනීමට කරන ලද ඉල්ලීම, ඔහු වෘත්තීය පුහුණු අධිකාරියට මුදාහරින ලද්දේ කවර කාණ්ඩය යටතේදැයි යන්න නොපැහැදිලිය යන අදහස මත මෙතෙක් ඉටු වී නොමැති බවත්;

(v) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්, විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල් ඇමතූ අංක PNS/P/P7/PEN/PROB(ii)/TEM දරන 2016.07.14 දිනැති ලිපියෙන් නිරීක්ෂණ ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ප්‍රේමතිලක මහතාගේ විශ්‍රාම හිමිකම් ලබාදීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1377/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 131 වැනි යෝජනාවට අනුව, කෘෂිකර්ම ව්‍යාපෘති නිලධාරින්ගේ දැනුම පෞද්ගලික අංශයේ ගොවිපලවල් සඳහාද ගාස්තුවක් අය කර ලබාදීමට යෝජනා කළ බව පිළිගන්නේද;

(ii) එසේ ගාස්තුවක් අයකර පෞද්ගලික අංශයට දැනුම ලබා දුන් රාජ්‍ය නිලධාරින්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(iii) කෘෂි ව්‍යාපෘති නිලධාරින්ගේ දැනුම ලබාගත් පෞද්ගලික අංශයෙහි සමාගම්වල ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?